සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 06 - 2023

## කතෝලික ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I - කොටස

- අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) ශු.බයිබලයේ පැරණි ගිවිසුමට අයත් පොතක් වනුයේ,

1. ගීතාවලිය. 2. ජොහාන් ශුභාරංචිය.
3. රෝම ලිපිය. 4. එළිදරව්ව ග්‍රන්ථය.

02) මිනිසා ඉදිකළ බාබෙල් කොත පිළිබඳ සඳහන් වන්නේ,

1. ගණන් කතාවේය. 2. උත්පත්ති පොතේය.
3. නික්මයාම පොතේය. 4. ලෙවී ව්‍යවස්ථාව තුළය.

03) සංගණනය ගැනීම හේතුවෙන් ජුසේ තුමා ගිය නුවර වන්නේ,

1. රෝමය 2. ගලීලය 3. බෙත්ලෙහෙම 4. ජෙරුසලම

04) සුවදානයේ දේව ප්‍රසාද නිධානයක් වන්නේ,

1. සමඟි සන්ධානය. 2. ප්‍රසාද ස්නාපනය.
3. පූජකවරය. 4. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ.

05) ප්‍රසාද ස්නාපනයේ දී "පාපයට මිය යාම හා වරප්‍රසාදීය ජීවිතයකට උත්ථාන කරනු ලැබීම" සංකේතවත් කරනු ලබන්නේ,

1. පාස්කු ඉටිපහන තුළිනි. 2. සුදු වස්ත්‍රය තුළිනි.
3. ශු.තෛලය තුළිනි. 4. ජලය තුළිනි.

06) දෙව් මව්න්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍ය සමරනු ලබන්නේ,

1. ජනවාරි 01 දාය. 2. අගෝස්තු 15 දාය.
3. දෙසැම්බර් 08 දාය. 4. දෙසැම්බර් 25 දාය.

07) සමිඳාණන් වහන්සේ සුදනන් හා දුදනන් හට,

1. වැසි වස්සන සේක. 2. හිරු එළිය උදාකරන සේක.
3. ආලෝකය වන සේක. 4. ප්‍රේම කරන සේක.

08) ශු.සභාවේ ශික්ෂා පද ගණන වනුයේ,

1. 5 කි. 2. 6 කි.
3. 4 කි. 4. 10 කි.

09) අධෛර්යයට පත් නොවී නොකඩවා යාච්ඤා කළ යුතු බව පෙන්වාදෙන උපමාවක් වන්නේ,

1. වපුරන්නා පිළිබඳ උපමාව.
2. ධනපතියා හා ලාසරස් පිළිබඳ උපමාව.
3. අධර්මිෂ්ඨ විනිශ්චකාරයා පිළිබඳ උපමාව
4. යහපත් සමාරියා පිළිබඳ උපමාව.

10) අපගේ විශ්වාසයේ සාරාංශය වනුයේ,

1. උදය ආරාධනාව.
2. ත්‍රිත්ව ස්තෝත්‍ර ගැදුමය.
3. නමෝ මරිය යැදුමය
4. විශ්වාස ලක්ෂණය ය.

(ලකුණු : 2x10 = 20)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට සුදුසු වචනය වරහන තුළින් තෝරා ලියන්න.**

11) නික්මයාම ගමන අතරතුර වූ සුවිශේෂී සිදුවීම ......................................... ලබා දීමය.

12) ස්නාවක ජොහාන් තුමාගේ දේශනයෙන් ආරම්භ වන ශුභාරංචිය .................................. ය.

13) ................................... ආරක්ෂා කිරීම මිනිසා සතු වගකීමකි.

14) කිතුනු අප යාච්ඤා කිරීමේ දී විවිධ ................................... භාවිත කරයි.

15) එදිරිකාරයාට විරුද්ධව .......................................... නොකරන්න.

(දේව මැවිල්ල, දස පනත, එකට එක, මාක්, ඉරියව්)

(ලකුණු : 2x5 = 10)

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදිනම් ( ✓) ලකුණ ද වැරදිනම් ( x ) ලකුණ ද යොදන්න.

16) අන්තිම රාත්‍රී භොජනයෙන් පසුව ජේසුස් වහන්සේ ඔලීව කන්දට වැඩිය සේක. ( )

17) පාස්කු ඉරුදින පූජකවරය නැමති ප්‍රසාද නිධානය ස්ථාපිත කරන ලදී. ( )

18) දෙවියන් වහන්සේ තුන්වන දින ගොඩබිම හා ගස්කොළන් මවා වදාළ සේක ( )

19) දෙව්මව්න් ජපමාලය අතැතිව ශු - වින්සෙන්ති පාවුලා මුනිතුමාට දර්ශනය විය. ( )

20) ජේසුස් වහන්සේ මෙන් අපිත් ආධ්‍යාත්මිකව හා ශාරීරිකව වර්ධනය විය යුතුය ( )

(ලකුණු : 2x5 = 10)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01) i. ශුභාරංචි ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
ii. දෙවියන් වහන්සේ මිනිසාට දුන් වගකීම් දෙකක් ලියන්න.
iii. ජේසුස් වහන්සේගේ කැප කිරීමේ චාරිත්‍රයේ දී යොදාගනු ලැබූ පක්ෂීන් දෙදෙනෙක් නම් කරන්න.
iv. ශු.මාක්තුමා පිළිබඳ කරුණු දෙකක් ලියන්න.
v. ජේසු කුමරුන් බැහැ දැකීමට පැමිණි පුද්ගල කණ්ඩායම් දෙකක් ලියන්න.
vi. එක්වරක් පමණක් ලැබිය හැකි දේව ප්‍රසාද නිධාන දෙකක් නම් කරන්න.
vi. යාච්ඤා වර්ග දෙකක් නම් කරන්න.
viii. දේව මාතාවන් දර්ශනය වූ අවස්ථා දෙකක් ලියන්න.
ix. පොදු යැදුම්වල ප්‍රයෝජන දෙකක් ලියන්න.
x. විශ්වාසයේ සත්‍යතා දෙකක් නම් කරන්න. (ලකුණු : 2x10 = 20)

02) i. මැවිල්ලේ සෑම සතෙකුටම මිනිසා නම් තැබීම තුළින් ඉස්මතු වන කරුණු දෙකක් ලියන්න.
ii. සතර වන දින මවන ලද මැවිලි තුන ලියන්න.
iii. පුද්ගල විවිධත්වයට හා එකිනෙකාට ගරු කරමින් දිවි ගෙවීමට ඔබට කළ හැකි දේවල් පහක් ලියන්න.
(ලකුණු : 2+3+5 = 10)

03) i. ජේසුස් වහන්සේ වෙනුවෙන් සිදුකළ පුදා චාරිත්‍ර දෙකක් ලියන්න.
ii. ජේසුස් වහන්සේ වර්ධනය වූ ආකාර තුනක් ලියන්න.
iii. ඔබගේ පෞරුෂය වර්ධනය කර ගැනීමට කළ හැකි දේවල් පහක් ලියන්න.
(ලකුණු : 2+3+5 = 10)

04) i. ප්‍රසාද ස්නාපනයේ දි භාවිත වන සංකේත දෙකක් නම් කරන්න.
ii. සමගි සන්ධානය ලබා ගැනීමේ පියවර තුනක් ලියන්න.
iii. ලන්චියානෝ නුවර සිදු වූ දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්ය පිළිබඳව 1978 වර්ෂයේ දී කළ පර්යේෂණයේ ප්‍රතිඵල පහ ලියා දක්වන්න.
(ලකුණු : 2+3+5 = 10)

05) i. සැබෑ වූ එකම දෙවියන් වහන්සේට පමණක් නමස්කාර කිරීමට අපට නියම කෙරෙන පනත් දෙකක් නම් කරන්න.
ii. සබත් දින නොකළ යුතු කාර්යයන් තුනක් ලියන්න.
iii. දස පනත අනුව දිවි ගෙවීමට ඔබට ලැබෙන මාර්ගෝපදේශ පහක් ලියන්න.
(ලකුණු : 2+3+5 = 10)

06) i. “ස්වාමිවක් ආරාධනාව” හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.
ii. යාච්ඤාවක අඩංගු විය යුතු ලක්ෂණ තුනක් නම් කරන්න.
iii. කිතුනු වටිනාකම් වර්ධනය කර ගැනීමට ඔබට කළ හැකි දේවල් පහක් ලියන්න. (ලකුණු : 2+3+5 = 10)

07) i. ඔබ දන්නා පොදු යැදුම් දෙකක් නම් කරන්න.
ii. පොදු යැදුම් අන් අය සමඟ එකට එකතු වී උච්චාරණය කිරීමේදි අප ඒවා උච්චාරණය කළ යුත්තේ කෙසේද? කරුණු 3 ක් ලියන්න.
iii. ශ්‍රී ලංකාව වර්තමානයේ දී මුහුණ දී තිබෙන අර්බුදකාරී තත්වය හමුවේ මරි මවුන්ගේ පිහිටාශිර්වාදය ඉල්ලා යාච්ඤාවක් නිර්මාණය කරන්න. (ලකුණු : 2+3+5 = 10)